# ප්‍රාණඝාත ශික්ෂාපදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය පනාමුරේ චන්දිම හිමි

## ප්‍රවේශය

බුදුදහමේ ඉගැන්වෙන ශික්ෂා පද අතර ප්‍රධාන ශික්ෂා පදයක් ලෙස ප්‍රාණඝාත ශික්ෂා පදය පෙන්වාදිය හැකි ය. ගිහිපැවිදි භේදයකින් තොර ව එම ශික්ෂා පද පනවා තිබීමෙන් එහි ඇති වැදගත් බව ගම්‍ය වෙයි. ඒ අනුව පරපණ නැසීම බුදු දහමට ඉඳුරා ම විරුද්ධ ය. ''පණ'' යන වදනින් අදහස් වන්නේ කුමක් ද යන්න විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙන් කෙරෙයි.

## සාකච්ඡාව

ප්‍රාණඝාතය සිදු කරන්නන් ඒකාන්තයෙන් ම නිරයෙහි උපත ලබන බව කියවේ.[1] එසේ ප්‍රාණඝාතය කරන්නන් ද කරවන්නන් ද එහි අනුසස් කියන්නන් ද ඒවා අගය කරන්නන් ද අපාගාමී වන බව දක්වා ඇත.[2] මෙ මගින් ද මෙම ශික්ෂා පදයෙහි බරපතලකම අවබෝධ කරගත හැකි ය. සම්බුද්ධ ශාසනය ආරම්භ වූ මුල් කාලයේ දී භික්ෂූන් වහන්සේලාට පනවන ලද ශික්ෂා පදයක් ලෙස ''පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිත සත්ථො ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූත හිතානුකම්පි විහරති''[3]

මෙම ශික්ෂා පදය ක්‍රියාත්මක වූ මුල් අවධියේ භික්ෂු ශාසනය සාමණේර උපසම්පදා වශයෙන් කොටස් දෙකකට නො බෙදී තිබූ අවධිය විය. මෙම මූලික ඉගැන්වීම පසු කාලීන වන විට විවිධ ආකාරයට පරිවර්තනය විය.

එය උපාසක උපාසිකා හමු වේ පරපණ නැසීමෙන් වෙන් වෙමි. යනුවෙන් දක්වා ඇත. සාමණේර භික්ෂූන් වහන්සේලා උදෙසා ද එසේ ම විය. එහෙත් උපසම්පදා භික්ෂූන් විෂයෙහි දක්වා ඇති මෙම ශික්ෂා පදයේ ප්‍රභේද කිහිපයක් දැකිය හැකි ය. ඒ අනුව මිනිස් ජීවිතයක් තොර කිරීමෙන් උපසම්පදා භික්ෂුවට ලැබෙන විපාකය වන්නේ පාරාජිකාපත්තිය යි.[4] එහෙත් මිනිසුන් හැර වෙනත් ප්‍රාණයක හෝ ජීවයක ප්‍රාණය තොර කළ හොත් එම භික්ෂුව පාචිත්තිය ආපත්තියකට යටත් වෙයි. එය ඔහුට විනය කර්ම ආදිය කිරීමෙන් නැවත භික්ෂු සමාජයේ ස්ථිර සාමාජිකත්වය ලබා ගත හැකි ය. මෙහි දී වැදගත් වන දෙය නම් මිනිසෙකු හෝ සත්වයෙකු ඝාතනය කිරීමෙන් ලැබෙන විපාක සමාන ද නැද්ද යන්න යි. කරුණු විමසීමේ දී පැහැදිලි වන්නේ එම කරුණු දෙකෙන් ම ලැබෙන විපාකය සමානය යන්න යි.

එය කොටස් දෙකක් යටතේ දක්වා ඇත්තේ සංඝ සමාජයේ ස්ථරයක් නියෝජනය කිරීමට මිස එහි විපාකය තීරණය කිරීමට නො වේ. ඒ අනුව පැහැදිලි වන්නේ ප්‍රාණ යන්නෙන් මිනිසුන් හා සත්වයන් හැඳින්වෙන බව පැහැදිලි ය. ඒ අනුව මිනිසුන් හෝ සත්වයන් ඝාතනය කිරීම ප්‍රාණඝාත ගණයට ගැනෙන බව පැහැදිලි ය.

දීඝ නිකායේ වාසෙට්ඨ සූත්‍රයට අනුව භික්ෂූන් සඳහා ක්‍රියාත්මක වූ ''බීජගාම භූතගාම සමාරම්භ පටිවිරතො හොති''[5] යන ශික්ෂා පදයට අනුව ඇටවලටත් පැළවලටත් හානි පැමිණවීම ගැන අවධානය යොමු කොට ඇත. උපසම්පදා භික්ෂූන් වහන්සේලා උදෙසා ද පාචිත්තිය ඇවතක් මෙසේ දක්වා ඇත. ''භූතගාම පාතව්‍යාතාය පාචිත්තියන්ති''[6] මෙ මගින් වෘක්ෂලතාවලට හානි පැමිණවීම තහනම් කොට ඇත. එ වැනි ආකාරයේ ශික්ෂා පදයක් පැනවීමට හේතු වූ කරුණු ලෙස එකල වැසියන් ශාකවලට ජීවය ඇති බව විශ්වාස කළ බැවින් ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයන් එය නො සලකති යි යන හැඟීම ඇති වී උද්ඝෝෂණයක් ඇති විය හැකි බවත් දක්වා ඇත.[7]

ප්‍රාණයට හානි කිරීමෙන් වැළකිය යුතු ය යනුවෙන් පැන වූ ශික්ෂා පදයක් ම ජීවයට හානි කිරීමෙන් වැළකිය යුතු ය යනුවෙන් පනවා තිබීමෙන් පැහැදිලි වන්නේ ජීවය හා ප්‍රාණය සම තත්වයෙහි ලා සැලකීමට බුදුරජාණන් වහන්සේ උත්සාහ ගෙන ඇති බව යි. ඒ අනුව උපසම්පදා ශීලය රකින භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් තුන්වෙනි ශික්ෂා පදයක් අනුගමනය කර තිබේ. එය ශාක ප්‍රාණ යනුවෙන් හඳුන්වා ඇත.

මෙම ශාක ප්‍රාණය උපසම්පදා භික්ෂුවකට පමණක් සීමා කර තිබෙන්නේ උන් වහන්සේ විසින් ආරක්ෂා කරන සීලය පදනම් කරගෙන ය. එහෙත් මෙහි දී අපගේ අවධානයට ලක් විය යුතු වන්නේ මුල් කාලීන බුදු සමයේ සිව්වනක් පිරිසට ම මෙය ප්‍රාණඝාතයක් ලෙස පනවා තිබුණේ ද යන්න විමර්ශනය කිරීම යි.

මුල් කාලීන බුදු සමයේ පණ ඇති අය හැඳින්වීම සඳහා පාණ, භූත සහ සත්ත යන පදයන් භාවිත කොට ඇත. බෞද්ධයන් අතර ඉතා ජනප්‍රිය සූත්‍රයක් වන කරණීයමෙත්ත හෝ මෙත්ත සූත්‍රයේ දී පණ ඇති අය කොටස් පහකට බෙදා දක්වා ඇත.

''යෙකෙචි පාණ භූතත්ථි තසාවා ථාවරාවා අනවසෙසා
දීඝාවායෙ මහන්තාවා මජ්ඣිමා රස්සා කාණුකථූලා
දිට්ඨා වා යෙව අද්දිට්ඨා යෙච දූරේ වසන්ති අවිදූරෙ භූතා වා සම්භවෙසීවා

තස / ථාවර
දිට්ඨ / අදිට්ඨ } - දෘෂ්ටිය
දූරෙ / අවිදූරෙ - දකින අය නො දකින අය
භූත / සම්භවේසී } - කාලය
දීඝ / මහන්ත / මජ්ඣිම / රස්සක / අණුක / ථූල - ප්‍රමාණය

මෙම සියලු ප්‍රභේදයන් ප්‍රාණ වශයෙන් සැලකිය හැකි ය. ඒ අනුව මෙහි ප්‍රාණ වශයෙන් ගැනෙන්නේ මනුෂ්‍ය / සත්ව / ශාක එක් කාලයට පමණක් අයත් සත්වයන් නො ව දැනට ජීවත් වන හා ජීවත් වූ යන සියලු දෙනා ම මේ ගණයට ගැනෙන බව පැවසිය හැකි ය. එයින් ලොව ජීවත් වන සියලු ත්‍රිවිධ ප්‍රාණීන් ගම්‍ය කර ඇති ආකාරය දැකිය හැකි ය.[8] එනම් මනුෂ්‍ය සත්ව හා ශාක යන්න යි.

ලොව ජීවත්වන සමස්ත සත්වයන් කොටස් පහකට බෙදා දක්වා ඇති ආකාරය ඉහතින් දක්වා ඇති මෙත්ත සූත්‍ර විග්‍රහයෙන් පැහැදිලි කරන ලදි. එහි එන තස / ථාවර යන පදයේ අර්ථය මෙහි දී විශේෂයෙන් සැලකිල්ලට ගත යුතු ය. බොහෝ විවාදයන්ට ගොදුරු වී ඇති පදයක් වන මෙහි අර්ථය ශබ්දකෝෂවල යොදා ඇති ආකාරය විමර්ශනය කළ යුතු ය. ඒ අනුව මඬිතියවෙල සිරිසුමංගල හිමිගේ පාලි සිංහල ශබ්ද කෝෂයේ තස යන්නෙන් දක්වා ඇත්තේ ඇවිදින දෙය, සෙලවෙන වස්තුව ය.[9] චඤ්චල වන තැතිගන්නා යන අර්ථ ද එහි ඇතුළත් වී ඇත. ථාවර යන වචනය නො සෙලවෙන වෙනස් නො වන යන අර්ථයෙන් ඉහත ශබ්දකෝෂයෙහි දක්වා ඇති අයුරු පැහැදිලි කරගත හැකි ය.[10]

මෙම පාඨය සුත්ත නිපාත අටුවාව වන පරමත්ථ ජෝතිකාවෙහි මෙසේ දක්වා ඇත.

''තසාවා ථාවරාවා අනවසෙසා වා ඉමිනා දුක්ඛේන සඞ්ගහෙත්වා දස්සෙති තත්ථ තසන්තීති තසා. සතණ්හානං සභයානං එතං අධි වචනං''[11]

මෙම විග්‍රහයෙන් ද පැහැදිලි වන්නේ ශබ්දකෝෂ ආචාර්යවරුන්ගේ අදහස ම බව පැහැදිලි ය. ඒ අනුව තස යනුවෙන් අටුවාචාරීන් වහන්සේලා පවසන්නේ බියට පත් සෙලවෙන සුලු මිනිසුන් ය. දමනය වුණු ස්ථාවර වූ අය හැඳින්වීම සඳහා ''ථාවර'' යන පදය භාවිත කොට ඇත. ඒ අනුව ථාවර යනු නො සෙලවෙන රහතන් වහන්සේ ය. **සාරත්ථප්පකාසිනී නම් වන සංයුක්ත නිකායේ අටුවාවේ** මෙසේ දක්වා ඇත.

තස යනු තෘෂ්ණාව ඇති අය යි. ථාවර යනු තෘෂ්ණාව ක්ෂය කළ අය යි.[12] මේ අනුව සම්ප්‍රදායානුකූල ව තස යනු පෘථග්ජනයා ය. ථාවර යනු රහතන් වහන්සේ ය. **සුත්ත නිපාතයේ** ඛග්ගවිසාණ සූත්‍ර අටුවාවේ ද මෙම කාරණය ඒ ආකාරයෙන් ම දක්වා ඇත. එහෙත් මෙම වදන් දෙක යුගල වශයෙන් එනම් තසථාවර වශයෙන් බහුල ව යෙදී ඇත්තේ ප්‍රාණයේ හා ජීවයේ සියලු ශාඛා ප්‍රශාඛා හැඳින්වීමට බව පැහැදිලි ය. මෙහි දී වැදගත් වන සූත්‍ර දේශනාවක් වන වාසෙට්ඨ සූත්‍රයේ මෙසේ දැක්වෙයි.

තෙසං වොහං බ්‍යාක්ඛිස්සං - අනුපුබ්බං යථාතථං
ජාති විභාගං පාණානං - අඤ්ඤමඤ්ඤාහි ජාතියො[13]

මෙහි දී බුදුන් වහන්සේ වාසෙට්ඨ බ්‍රාහ්මණයාට ජාති විස්තරය හෙවත් ජාති විභාගය අනුපූර්ව ප්‍රතිපදාවෙන් දක්වා ඇත. ජාතීහු අන්‍යෝන්‍යයහ. හෙවත් නානාප්‍රකාර ය. ඒ අනුව එහි ජාති ප්‍රභේද හයක් දක්වා තිබේ.

1. තිණ රුක්ඛෙපි ජානාථ න චාපි පටිජානරෙ[14]
2. තතො කීටෙ පටංගෙ ච යාව කුන්ථ කිපිල්ලකෙ[15]
3. චතුප්පදෙපි ජානාථ ඛුද්දකේච මහල්ලකෙ[16]
4. පාදුදරෙපි ජානාථ උරගෙ දීඝපිට්ඨිකෙ[17]
5. තතො මච්ඡෙපි ජානාථ උදකේ වාරි ගොචරේ[18]
6. තතො පක්ඛීපි ජානාථ පත්තයානෙ විපාංගමෙ[19]

මේ අනුව ජාතිහූ වර්ග මෙසේ ය.

1. වෘක්ෂ හා තෘණ
2. මේරු සහ කුඹීන් හා කෘමීහු
3. සිව්පාවෝ
5. මත්ස්‍යයෝ
6. පක්ෂීහු

ඉහත සූත්‍රය තුළ දී බුදුන් වහන්සේ ප්‍රාණ යන්නෙන් ගැනෙන විවිධත්වය දක්වා ඇත. ඒ අනුව ප්‍රාණයන් ගණයට ගැනෙන දෙකක් ලෙසට වෘක්ෂ හා තෘණ ඇතුළත් කිරීමට පසුබට වූ බවක් පැවසිය නො හැකි ය. එසේ ම මෙම වාසෙට්ඨ සූත්‍රය අවධාරණය කරන කරුණින් පැහැදිලි වන්නේ මනුෂ්‍ය, සත්ව හා ශාක යන තුන ම පණ ඇති ගණයෙහි ලා සැලකීමට මුල් බුදු සමය ක්‍රියා කර ඇති බව යි. එහෙත් මෙහි දී අවධාරණය කළ යුතු කරුණු වන්නේ වෘක්ෂ හෝ තෘණවලට පණ ඇති බව ඒවා නො දන්නා බව යි. (නචාපි පටි ජානරෙ) යනුවෙන් දක්වා තිබීමෙන් ඒ බව පැහැදිලි වෙයි.

**සුත්ත නිපාතයේ** සඳහන් වන තසථාවර යන්නෙන් ප්‍රාණයෙහි ප්‍රභේදයක් අන්තර්ගත වන බැවින් හා වාසෙට්ඨ සූත්‍රයෙහි ප්‍රාණ ගණයට මනුෂ්‍ය, සත්ව හා ශාක යන ත්‍රිවිධ ප්‍රාණය ම දක්වා ඇති බැවිනුත් තසථාවර යන්නෙන් ත්‍රිවිධ ප්‍රාණය ම කියවෙන බව අවධාරණය කළ හැකි ය.

මේ සම්බන්ධයෙන් වැදගත් අදහසක් ගිහිවත නමින් හැඳින්වෙන ධම්මික සූත්‍රයේ දැක්වෙයි. එම සූත්‍රයෙහි ගිහියා විසින් සම්පූර්ණ කළ යුතු ප්‍රතිපත්ති සමුදායක් දක්වා ඇත.

'' පාණං න හානෙ නච ඝාතයෙය්‍ය
නචානුජඤ්ඤා හනතං පරෙසං
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙථාවරායෙච තසන්තිලොකෙ''[20]

ගිහි පුද්ගලයා විසින් ප්‍රාණය නො නැසිය යුතු ය. අනුන් ලවා නො නැස්විය යුතු ය. අනුන් පණ නසනු නො ඉවසිය යුතු ය. තස හෝ ථාවර වශයෙන් ගැනෙන සියලු ප්‍රාණීන්ට හිංසා පීඩා කිරීමෙන් ඔහු වැළකිය යුතු ය. මෙය ගිහියාගේ නිත්‍ය ශීලය වන පංච සීලයෙහි උගන්වන පළමු වන ශික්ෂාපදය යි. එය පරපණ නැසීමෙන් වැළකෙමි යනුවෙන් සරල ව ගත නො හැකි ය. තස හා ථාවර යන සියලු ප්‍රාණීන් ගිහියන් විසින් නො නැසිය යුතු ය. මේ අනුව පැහැදිලි වන්නේ මුල් බුදු සමයේ ගිහියාට ද වෘක්ෂ ඡින්දනය තහනම් කොට ඇති බව යි. එහෙත් එය එතරම් ප්‍රායෝගික නො වන බව හෝ දරුදඬු බව අවබෝධ කරගත් බුදුන් වහන්සේ ගිහියන් කෙරෙහි එබඳු ශික්ෂාපද පැනවීමට මැළි වූ බවක් දැකිය හැකි ය. එකල සමාජයෙහි එනම් ක්‍රි.පූ. 6 වන සියවසෙහි භාරතීය සමාජය තුළ මේ සම්බන්ධ විශාල කතිකාවතක් ඇති වී තිබූ බවත් මෙහි දී අවබෝධ කර ගත යුතු ය.

ඇතැම් පාචිත්තියාපත්ති පනවන විට බුදුන් වහන්සේ පෙන්වා දුන්නේ ශ්‍රමණභවත් ගෞතමයන්ගේ ශිෂ්‍යයන් ඒකබීජී ජීවීන් විනාශ කරන්නේ ය යන චෝදනාව ද ඇතිවිය හැකි බව යි. එය ද සැලකිල්ලට ගත් බව කිව යුතු ය. එහෙත් මෙහි දී පැහැදිලි කළ යුතු වැදගත් ම කාරණය වන්නේ ගිහියාට වුව ද සිතූ සිතූ ලෙස අත්තනෝමතික ව ගස් කැපීම හෝ තෘණ කැපීම හෝ විනාශ කිරීම පරපණ නැසීමක් ලෙස මුල් බුදු සමය සලකා ඇති බව යි.

## නිගමනය

මෙම ශික්ෂා පදය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී සැලකිය යුතු තවත් කරුණක් මෙහි දී සඳහන් කළ යුතු ය. එනම් අතීත ශ්‍රී ලාංකීකයා මේ බව දැනගෙන ක්‍රියා කළ බව යි. අතීත සිංහල බෞද්ධයා විහාරස්ථානයට බීජයක් ඇතිවිය හැකි දෑ (පුවක් වැනි දෑ) රැගෙන එන විට එය නැවත හට නො ගන්නා ආකාරයට දෙකෙළවර ඉවත් කොට රැගෙන ඒම යි. ඒ අනුව ශාකයක් ඇති විය හැකි යම් බීජයක් විනාශ කිරීමට භික්ෂුවට නුසුදුසුය යන අවබෝධය අතීත ශ්‍රී ලාංකිකයා තුළ පැවති බව යි.

නූතන ශාක විශේෂඥයන්ගේ වාර්තාවලට අනුව ද පෙන්වා දිය හැකි වන්නේ යහපත් වචන කියන කරුණාවෙන් ආමන්ත්‍රණය කරන මල් ගස් හෝ ඵල ගස් ඉතා සරු ලෙස මල්ඵල දරන බවත් අසැබි වදන් අසන ගස්වල මල්ඵල සරු ලෙස හට නො ගන්නා බවත් පෙන්වා දෙයි. එ මගින් ද පැහැදිලි වන්නේ බුදුන් වහන්සේ අවධාරණය කරන තසථාවර යන දෙපදයෙන් මිනිස්, සත්ව හා ශාක යන ත්‍රිවිධ ප්‍රාණය ම අන්තර්ගත වන බව යි.

විශ්වීය ධර්මයක් වන බුදුදහමෙන් ජීවී අජීවී සියලු සතුන්ට මෛත්‍රීය කළ යුතු බව අවධාරණය කිරීම මගින් ද පැහැදිලි වන්නේ ශාකයන් ද ප්‍රාණයන් සේ සලකා ඇති බව යි. ඒ අනුව ප්‍රාණගත ශික්ෂා පදයට ගසක් විනාශ කිරීම ද අයිති වන බව පෙන්වා දිය හැකි ය.

## ආන්තික සටහන්

1 **අං. නි. චතුක්ක නිපාතය**, මඩල වර්ගය, පාණාතිපාත සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 159 පිටුව.
2 **අං. නි. චතුක්ක නිපාතය**, කම්මපථ වර්ගය, පාණාතිපාත සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 487 පිටුව.
3 **දීඝනිකාය, බ්‍රහ්මජාල සූත්‍රය**, ත්‍රි.බු.ජ.මු. 03 පිටුව.
4 **විනය පිටකය, පාරාජිකපාළිය,** තෙවන පාරාජිකය, ත්‍රි.බු.ජ.මු. 159 පිටුව.
5 **දීඝනිකාය, බ්‍රහ්මජාල සූත්‍රය**, ත්‍රි.බු.ජ.මු. 03 පිටුව.
6 **විනය පිටකය**, පාචිත්තිය පාලි, භික්ඛු වග්ගය, ත්‍රි.බු.ජ.මු. 106 පිටුව.
7 - එම -
8 **සුත්ත නිපාතය**, උරග වග්ගය, මෙත්ත සූත්‍රය - ත්‍රි.බු.ජ.මු. 49 පිටුව
9 මඩිතියවෙල සිරිසුමංගල හිමි, **පාලි සිංහල ශබ්දකෝෂය**, 215 පිටුව.
10 - එම -
11 **පරමත්ථ ජෝතිකා නාම සුත්ත නිපාත අට්ඨකතා**, සයිමන් හේවාවිතාරණ, ග්‍රන්ථමාලා. එස්. ඇන්ඩ්. එස්. ප්‍රින්ටර්ස් නො. 49, ජයන්ත වීරසේකර මාවත, කොළඹ-10, 141 පිටුව, 2010.
12 **සාරත්ථප්පකාසිනී සංයුක්ත නිකාය අට්ඨකතාව**, සයිමන් හේවාවිතාරණ මුද්‍රණ 1924, 198 පිටුව.
13 **ම. නි. බ්‍රාහ්මණ වග්ගය**, වාසෙට්ඨ සූත්‍රය, ත්‍රි.බු.ජ.මු, 702 පිටුව.
14 - එම -
15 - එම -
16 - එම -
17 - එම -
18 - එම -
19 - එම -
20 **සුත්ත නිපාතය**, චුල්ල වග්ගය, ධම්මික සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 118 පිටුව.